# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

## එකතු කළ අගය මත වන බදු සඳහා ලියාපදිංචි තැනැත්තන් වෙත කෙරෙන නිවේදනයයි

**දේශීය ආදායම් වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන විද්‍යුත් සේවාවන් භාවිතා කරමින්, එකතු කළ අගය මත බදු (එ.අ.බ) සඳහා විද්‍යුත් ගොනු ගත කිරීම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී තිබේ.**

**එහිදී, එ.අ.බ. වාර්තාව හා එහි උපලේඛනයන් ඉදිරිපත් කිරීමේදී පහත සඳහන් කරුණු පිළිබඳව ඔබ සැලකිලිමත් විය යුතුය :**

- විද්‍යුත් සේවාවන් යටතේ වාර්තා ඉදිරිපත් කිරීම සඳහා විද්‍යුත් ගොනුගත කිරීමේ පහසුකම් දේශීය ආදායම් වෙබ් අඩවිය මගින් ලබා දී ඇත. (www.ird.gov.lk).
- විද්‍යුත් ගොනුගත කිරීමේ ක්ෂණික උපදෙස් (Quick Guides) හා ආදර්ශ උපලේඛන (Schedule Templates) වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.
- ඔබ සමාගමක් නම්, විද්‍යුත් ගොනුගත කිරීමේ කාර්යයන් සඳහා ඔබගේ කාර්ය මණ්ඩලය පත් කිරීම සහ ඔවුනට බලය පැවරීම සඳහා ඔබට භාවිතා කළ හැකි විශේෂ කාර්ය මණ්ඩල හැඳින්වීමේ අංක (SSID) ඇතුළත් ලැයිස්තුවක් සහිත ලිපියක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙතින් ඔබ වෙත දැනටමත් එවා ඇත.

  මෙම අංකයන් මෙතෙක් ඔබ වෙත ලැබී නොමැති නම් සහ එම පහසුකම මෙතෙක් ඔබ ලබාගෙන නොමැති නම්, එය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ **ප්‍රධාන කාර්යාලයේ බදු සේවා අංශයෙන්** හෝ **දේශීය ආදායම් වෙබ් අඩවියේ ඇති විද්‍යුත් සේවාවන්** හරහා ලබා ගත හැකිය.
- එ.අ.බ. වාර්තාව සමඟ ඊට අදාළ උපලේඛන ද ඉදිරිපත් කිරීම **අනිවාර්ය** වන අතර, එසේ කටයුතු නොකලහොත් එම වාර්තාව නීතියේ විධිවිධාන අනුව වාර්තාවක් ලෙස පිළිගනු නොලැබේ.
- එ.අ.බ. උපලේඛනයේ ඇතුළත් **අයිතමයන් ගණන 20 ඉක්මවන්නේ නම්** ඔබගේ උපලේඛන ඔබ විසින් විද්‍යුත් ගොනු ගත කිරීම **අනිවාර්ය** වන අතර, එවැනි උපලේඛන රැගෙනවිත් භාර දිය නොහැක.

  එසේ වුවද, එ.අ.බ. උපලේඛනයේ ඇතුළත් **අයිතමයන් ගණන 20 ට වඩා අඩු** අවස්ථාවකදී වුවද ඔබගේ කැමැත්ත අනුව උපලේඛන රැගෙනවිත් භාර දීම හෝ විද්‍යුත් ගොනුගත කිරීමේ පහසුකම භාවිතා කල හැක. කෙසේ නමුත් විද්‍යුත් ගොනුගත කිරීම, බදු කාර්ය කාර්යක්ෂම කිරීමට ඉවහල් වේ.
- එ.අ.බ. උපලේඛන විද්‍යුත් ගොනුගත කිරීම සඳහා වන සහාය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ බිම් මහලේදී ඔබට ලබා ගත හැක.

කාරුණාකර ඔබගේ වාර්තා හා උපලේඛන නියමිත දිනට පෙර ඉදිරිපත් කර අවසන් මොහොතේ දී ඇති වන තදබදය හා අපහසුතා වැලැක්වීමට සහයවන්න.

**වැඩිදුර පැහැදිලි කර ගැනීම් සඳහා දේශීය ආදායම් ඇමතුම් මධ්‍යස්ථානයේ (Call Centre) 1944 අංකයට අමතන්න.**

දේශීය ආදායම් වෙබ් අඩවිය - **www.ird.gov.lk**

**දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්**

**බදු - වඩා හොඳ අනාගතයකට**